# පරිසරය රැකිය හැකි ද?

අපි තවත් පරිසර සතියක් ගෙවමින් සිටිමු. දැනට අවුරුදු කිහිපයකට පෙර අපිදු පරිසරය ගැන ලීවෙමු. එකල පරිසරය ගැන පමණක් නොව දර්ශනය, ආයුර්වේදය, සාහිත්‍ය විචාරය ආදී බොහෝ ක්ෂෙත්‍ර අපේ සාකච්ඡාවට බඳුන් විය. එහෙත් දේශපාලනය වේදිකාවේ මධ්‍යයට පැමිණීමෙන් පසුව එවැනි ලිපි ලිවීම අඩුවිය. දැනට එවැනි ලිපි ලියැවෙන්නේ විදුසර පුවත්පත ඔස්සේ ය. අවුරුදු දහතුනකට එහා පැත්තේ පරිසරය ගැන ලියැවුණු ලිපි කිහිපයක් පසුගිය දා පරිසරය හා බටහිර ආකල්ප යනුවෙන් පළවිණි.  ඒ පොතට රියේ පෙරදා ලියූ පෙරවදනෙන් උපුටාගත් කොටස් කිහිපයක් පහත පළවෙයි. එකල ලියූ ඇතැම් ලිපියක යුදෙව් චින්තනය යනුවෙන් හැඳින්වෙන්නේ අද අප ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තතනය යනුවෙන් හඳුන්වන්න ය. අපේ විචාරකයෝ අප ඕනෑම එකකට හේතුව ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය යැයි කියන බව පවසති. මුළු මහත් බටහිර දැනුම ම පදනම් වී ඇත්තේ ඒ චින්තනය මත බැවින් අපට බොහෝ විට ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ගැන කතාකිරීමට සිදුවීම අරුමයක් විය නො හැකි ය. අනෙක් අතට මේ අනුකාරකයන්ට කීමට තවත් වැදගත් කරුණක් වෙයි. එනම් චින්තනය යන්න ඌනිතවාදීව ලබාගත් නොවන්නක් බවත් සියල්ල චින්තනයට ඌනනය නොකළ හැකි බවත් එය සමස්තය පිළිබඳ නිර්මාණය කර තිබෙන සංකල්පයක් බවත් ය.

“අපේ අදහස් වර්ධනය කරගැනීමට අපට ජර්මනියේ හෝ වෙනත් බටහිර රටක ඊනියා හරිත ව්‍යාපාරයක අදහස් අවශ්‍ය නො වී ය. හරිත ව්‍යාපාරවල ද අදහස් වර්ධනය වී ඇත්තේ බටහිර චින්තන රාමුවෙහි ය. ඒ අදහස්වලින් අපට එතරම් ගතයුතු දෙයක් නොමැති බව අපේ අදහස වෙයි.

බටහිර විද්‍යාවටවත් ඒ ද ඇතුළත් වූ බටහිර දැනුමටවත් පරිසරය රැකීමට නො හැකි ය. කෙටියෙන් කිවහොත් බටහිරයන්ගේ සංස්කෘතියෙහි පරිසරය නො රැකෙයි. බටහිර රටවල උද්‍යාන තනා ඇති බවත් මහාමාර්ග හා වටාපිටාව පිරිසිදු ව පවත්වාගෙන බවත් ඇත්ත ය. එහෙත් ඒ කෘත්‍රිම වූවක් වෙයි. ඕසෝන් ස්ථරය විවර කෙරුණේත් හරිතාගාර ආවරණයක් ඇතිකෙරුණේත් බටහිරයන් අතින් මිස අනෙක් අයගේ දායකත්වයෙන් නො වෙයි. බටහිරයන්ට පරිසරය රැකිය හැක්කේ තම ආකල්ප හා චින්තනය වෙනස්කිරීමෙන් පමණකි. එහෙත් එවිට ඔවුන් තවදුරටත් අප අද භාවිතාකරන අර්ථයෙන් බටහිරයන් නොවනු ඇත. බටහිරයන් යනුවෙන් හඳුන්වනු ලබන්නෝ හුදෙක් බටහිර ජීවත්වන්නන් පිරිසක්  නො වෙති. ඔවුන්ට යම් චින්තනයක්, සංස්කෘතියක්, දැනුම් පද්ධතියක් ආදිය වෙයි. ඒ වෙනස් වුවහොත් ඔවුහු තවදුරටත් අප දන්නා ආකාරයෙන් බටහිරයෝ නො වෙති.

පරිසරය රැකීම යන්නට අප මෙහි අර්ථකථනයක් දී ඇත. රැකීම යන්නෙන් යමක් වෙනස් නොකිරීමක් අදහස් නො කෙරෙයි. සංස්කෘතිය රැකීම සම්බන්ධයෙන් ද ඒ කියමන අදාළ වෙයි. පරිසරය වෙනස් වෙයි. අප මෙන් ම සත්තු ද පරිසරය වෙනස්කරති. එහෙත් ඒ වෙනස්වීම සිදුවිය යුත්තේ ගතික සමතුලිතතාවකින් ය. එසේ නොවුවහොත් මහත් විනාශයක් සිදුවනු ඇත. පරිසරය අද මෙන් එදා අහිතකර අන්දමින් වෙනස් නොවිණි. එදා හේන් කෙටීම සඳහා කැලෑ කැපූ බව සැබෑ ය. එහෙත් ඒ සමග කැලෑ වැවෙන්නට ඇරීම ද සිදුවිය. කැලෑව හා හේන යනු දෙකක් නොව එකම පද්ධතියක කොටස් ලෙස එදා සැලකිණි. අද කැලෑව හෙට හේන ද, අද හේන හෙට කැලෑව බවට ද පත්විය. ඒ එදා ය. එහෙත් අද කැලෑ කැපෙන්නේ ඒ ආකාරයට නො වේ. කපන කැලෑවක් නැවතත් කැලෑවක් බවට පත්වීමට අද ඉඩක් නැත. එහි ගතික සමතුලිතතාවක් නැත. කැලෑව හා හේන අන්ත දෙකකට වෙන්කිරීමක් අපේ චින්තනයෙහි නො වී ය. වෙන්කිරීම ඉතා තදින් පැතිරගියේ බටහිර නූතනත්වයේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ය.

අවුරුදු ලක්ෂ ගණනාවක් මිනිස්සු ද සත්තු ද මිහිපිට ජීවත් වූහ. එහෙත් ඒ කිසිවකු අතින් පරිසරය විනාශ නො විණි. බටහිරයන් හා ඔවුන් අනුකරණය කරන ආසියාතිකයන් හා අප්‍රිකානුවන්, එදා මිනිසුන් කැලෑ කැපුවේ නැත් ද, ඉන්දියාවේ කරන්නාක් මෙන් ගොම පිළිස්සීමෙන් වාතය අපිරිසිදු නොවිණි ද ආදී ප්‍රශ්න අසන විට ඔවුන් මේ කතාකරන්නේ හොඳ සිහියෙන් දැයි නැවත ප්‍රශ්නකිරීමට සිදුවෙයි. පරිසර ජීවය යැයි මේ පෙතෙහි ලිපියක නම්කෙරී ඇති දැයට හෝ ගතික සමතුලිතතාවට හෝ ආසියාතිකයන්ගෙන් අප්‍රිකානුවන්ගෙන් හා එදා ජීවත් වූ ඇමරිකානු ගෝත්‍රවලින් පමණක් නොව අවුරුදු පන්සියයකට ඔබ්බෙන් ජීවත් වූ යුරෝපීයයන්ගෙන් ද සිදු වූ හානිය කුමක් ද?

© Prof. Nalin De Silva

පරිසර විනාශය ඇරඹී අවුරුදු පන්සියයකට වඩා නැත. පරිසර විනාශයක් සිදුවන බව තේරුම්ගෙන අවුරුදු දෙසීයක්වත් නැත. ඊනියා කාර්මික විප්ලවයෙන් පසු එංගලන්තයේ වායුව අපිරිසිදුවීම ඇරඹීමත් සමග පරිසරයට හානියක් වන බව ඉංගිරිසිහු තේරුම්ගත්හ. එහෙත් එයට හේතුව කුමක්දැයි ඔවුහු තේරුම් නොගත්හ. අද ද තේරුම් නොගනිති. බටහිරයන් දන්නේ ඒ ඒ අවස්ථාවෙහි ඇති වී තිබෙන ප්‍රශ්නය විසඳාගැනීමට යමක් කිරීම පමණ ය. එහෙත් ඔවුන් දෙන විසඳුම ක්ෂණික ප්‍රශ්නයට පිළිතුරක් වුව ද, ඒ ඊනියා විසඳුම හේතුවෙන් වෙනත් ප්‍රශ්න ඇතිවන බව ඔවුහු තේරුම් නො ගනිති. ඕසෝන් ස්ථරය විවරවීමට පිළියමක් ලෙස ඇතැම් වායු පිටකිරීම නැවැත්වීමට කටයුතු කළ ද, ඒ වායු වෙනුවට වෙනත් රසායනික ද්‍රව්‍ය පිටවීම නිසා අනාගතයේ දී ඇතිවිය හැකි ප්‍රශ්න පිළිබඳ ව ඔවුහු නො සිතති. ඒ බටහිරයන්ගේ ක්‍රමය ය.

මේ සියල්ලෙහි මුල පහළොස්වැනි සියවසේ යුරෝපයේ ඇති වූ පුනරුදය නමින් හැඳින්වෙන බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ය. මේ නූතනත්වය අවශ්‍ය නම් යුරෝපීය නූතනත්වය, මුළු ලෝකයම ආගමික වශයෙන් බැරිනම් සංස්කෘතික වශයෙන් ක්‍රිස්තියානි කිරීම, බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය ආදී නම්වලින් ද හැඳින්විය හැකි ය. ඒ සියල්ල එකට බැඳී ඇත. ධනපති ක්‍රමයෙහි ලාභ නිෂ්පාදනය, ශ්‍රමය සූරාකෑම ආදිය ද මේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සමග බැඳී ඇත. මාක්ස්වාදයෙහි මේ ශ්‍රමය සූරාකෑම විස්තර කිරීමට උත්සාහයක් ගෙන ඇත. එහෙත් එයට පෙර තවත් සූරාකෑමක් සිදුවෙයි. ඒ පරිසරය සූරාකෑම ය. ඒ පිළිබඳ මාක්ස්වාදය නිහඬ ය. මුළු මාක්ස්වාදී සාහිත්‍යයෙන් ම අහම්බයක් සේ ලියැවී ඇති එංගල්ස් මහතාගේ කියමනක් උපුටා දැක්වීමෙන් එලෙස නිහඬතාවක් නැතැයි කීමට තැත්කිරීම අල්ලෙන් විළි වසාගැනීමක් වෙයි.

පහළොස්වැනි සියවසේ යුරෝපයේ චින්තන විප්ලවයක් සිදුවිය. එතෙක් පැවති යුරෝපිය කතෝලික චින්තනය වෙනුවට අප විසින් ග්‍රීක යුදෙවු ක්‍රිස්තියානි චින්තනය ලෙස හැඳින්වෙන චින්තනය ඇතිවිණි. එසේ චින්තන විප්ලවයක් ඇතිවීමට හේතුව වෙනත් අවස්ථාවල දී සාකච්ඡා කෙරී ඇත. ග්‍රීක යුදෙවු ක්‍රිස්තියානි චින්තනයෙහි අංග රාශියක් වෙයි. ඉන් අපට වැදගත්වන්නේ පෞද්ගලිකත්වය ඉදිරියට ගැනීම, දැනුමේ වියුක්තකරණය, සීමාන්තික විශ්ලේෂණය, ලෝකය මිනිසා වෙනුවෙන් මවා ඇතැයි සැලකීම, ලෝකය මවා ඇත්තේ නියමවලට එකඟව බවත් ඒ නියම මිනිසාට සොයාගැනීමට (ඩිස්කවර් යන ඉංගිරිසි වදනින් කියැවෙන) හැකි බවත් පිළිගැනීම, දැනුම කරුණු ස්වල්පයකට ඌනනයකිරීම, මිනිසා ලෝකයෙන් ද එකිනෙකාගෙන් ද වෙන්කිරීම, එකිනෙකාගෙන් වෙන්කෙරී පෞද්ගලිකත්වය පෙරටගත් මිනිසාගේ ඉන්ද්‍රිය පිනවීමට හැකිතාක් අවස්ථා සැපයීම, සත්‍යය එකක් යැයි ගැනීම හා ඒ සත්‍යය තමන්ට කලින් සඳහන්කරනලද නියම මගින් ප්‍රකාශකිරීමට හැකියැයි සැලකීම, ඒ සත්‍යය සෙසු ලෝකයා මත පැටවීම යුරෝපීයයන් තම වගකීම ලෙස සැලකීම ආදිය ය.

මිනිසාට ඉන්ද්‍රියන් පිනවීමට අවස්ථා සැපයීම යනු අන්කිසිවක් නොව ඒ ඒ පුද්ගලයාට සිය අසීමිත ආශාවන් සන්තර්පණයකිරීම සඳහා ඉඩකඩ සැපයීම ය. එහෙත් මේ අසීමිත ආශාවන් සපුරාලිය හැක්කේ සීමිත ස්වාභාවික සම්පත් උපයෝගී කරගැනීමෙනි. අද දියුණුව ලෙස සැලකෙන්නේ ආශාවන් සන්තර්පණයකිරීම සඳහා බලශක්තිය වැඩි වැඩියෙන් පරිභෝජනයකිරීම ය. ලෝකයේ දියුණුම රට වශයෙන් සැලකෙන ඇමරිකානු එක්සත් ජනපදවල ඒක පුද්ගල බලශක්ති පරිභෝජනය වෙනත් කිසිම රටකට වඩා වැඩි ය. අද බටහිර දියුණුව හඹායෑම යනු අන්කිසිවක් නොව අපේ ඒක පුද්ගල බල ශක්ති පරිභෝජනය ඉහළ නැංවීම ය. දියුණුව යන්න අද හුදු ආර්ථික දියුණුවක් ලෙස සැලකෙයි. මේ අර්ථදැක්වීම හෙවත් නිර්වචනය කිරිම අද වන විට මුළු ලෝකය පුරාම ප්‍රචාරයකිරීමට බටහිරයෝ සමත් ව සිටිති.”

පරිසරය රැකීමට නම් බටහිර ග්‍රීක යුදෙවු ක්‍රිස්තියානි පැරදවිය යුතු ය. එහෙත් එය කියන තරම් පහසු නැති බව අප අමතක නොකළ යුතු ය. බටහිර විද්‍යාව, ධනපති ක්‍රමය ආදිය පදනම් වී ඇත්තේ ඒ චින්තනය මත ය. චින්තනයක් වෙනස්කිරීමෙන් මුළු මහත් සමාජය ම වෙනස් වෙයි. බටහිරයන් තමන්ගේ චින්තනය වෙනස්කිරීමට සූදානම් නැත. ඔවුහු අද පරිසරය රැකීමක් ගැන කතාකරති. එහෙත් ඉන් රැකෙන පරිසරයක් නැත. පරිසරය රැකුණහොත් බටහිර අද පවත්නා සමාජය නොරැකෙනු ඇත. බටහිරයනට අවශ්‍ය කුමක් රැකීමටදැයි කාහට වුවද පැහැදිලි විය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva